**සීමාසහිත ලංකා මිනරල් සැන්ඩ්ස් සමාගම - 2017**

**------------------------------------------------------------**

සීමාසහිත ලංකා මිනරල් සැන්ඩ්ස් සමාගමේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුලත් විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කල යුතු යැයි අදහස් කරන සමාලෝචිත වර්ෂයේ සමාගමේ ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් වූ මාගේ නිරීක්ෂණ මෙම වාර්තාවේ ඇතුළත් කර ඇත.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම

**------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

**--------------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාරධර්මවල අවශ්‍යතාවයන්ට අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලැසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරුකිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සමාගමේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුලත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා උචිත බව මාගේ විශ්වාසයයි

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**-------------------------------------------------------**

(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16 හි 51 ඡේදය අනුව, ජංගම නොවන වත්කම් සඳහා ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු.438,163,555 ක් වූ වත්කම් සම්පූර්ණයෙන්ම ක්ෂය කර ඇතත් තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව

ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 8 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) පසුගිය වර්ෂ 03 ක සිට ඛනිජ සංයුතිය සියයට 7.88 ක වැලි තොගයක් (block A tailing) රු. 607,463,314 කට අගය කර මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. එහෙත් ආයතනය සතු යන්ත්‍ර සූත්‍ර මගින් පෙරසැරිකල හැක්කේ ඛණිජ සංයුතිය සියයට 40 ක් වූ වැලිතොග පමණක් වූ අතර ඉහත ඛණිජ සංයුතිය සියයට 7.88 ක් වු වැලිතොගය අවසාන තොගයට ඇතුලත් කර තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයට අදාල ලාභය රු.172,595,796 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ) ඉකුත් වර්ෂයට අදාල රු.5,308,330 ක ඌන ආදායම් බදු වෙන් කිරීම් සමාලෝචිත වර්ෂයේ ආදායම් බදු වියදම් ලෙස දැක්වීමෙන් තොරව රඳවාගත් ලාභයට ගැලපීම්කර තිබුණි.

(ඈ) සමාගම විසින් සමාලෝචිත වර්ෂයේ ඉඩ නොහරින ලද දීමනා අඩුකර බදු වගකීම ගණනයකර තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයට අදාල බදු වගකීම රු.8,673,621 කින් අඩුවෙන් දක්වා තිබුණි.

## 2. මූල්‍ය ප්‍රකාශන

--------------------

### 2.1 තත්ත්වාගණනය කළ මතය

----------------------------------

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම ඡේදයේ දක්වා ඇති කරුණු වලින්වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2017 දෙසැම්බර් 31 දිනට සීමාසහිත ලංකා මිනරල් සැන්ඩ්ස් සමාගමේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

------------------------------------------------------------------

2007 අංක 07 දරන සමාගම් පනතේ 163 (2) වගන්තිය ප්‍රකාරව, මා විසින් පහත සඳහන් කරුණු දක්වමි.

(අ) තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම හා විගණනයේ විෂය පථය සහ සීමාකිරීම් ඉහත දක්වා ඇති පරිදි වේ.

(ආ) මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම ඡේදයේ දක්වා ඇති වැදගත් සීමා කිරීම්වලට යටත්ව,

- විගණනය සඳහා අවශ්‍ය තොරතුරු සහ පැහැදිලි කිරීම් ප්‍රමාණවත් ලෙස ලැබුණු බවත්, මාගේ පරීක්ෂණවලින් පෙනීයන අන්දමට සමාගම විසින් ප්‍රමාණවත් පොත්පත් හා වාර්තා පවත්වා ඇති බවත් ,
- සමාගමේ මූල්‍ය ප්‍රකාශන 2007 අංක 07 දරන සමාගම් පනතේ 151 වගන්තියේ අවශ්‍යතාවයට අනුකූල වන බවත් මා දරන්නා වූ මතය වේ.

## 2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) රාජ්‍ය ආයතනවලට ලබා දී තිබූ රු.45,000,000 ක මුදලක් වර්ෂ 06 කට අධික කාලයක් අයකර ගැනීමකින් තොරව අත්තිකාරම් ලෙස පැවතුණි.

(ආ) ආපසු ගෙවිය යුතු ලංසු තැන්පතු රු.21,807,204 ක් වසරක් ගතවී ඇතත් 2018 අගෝස්තු 30 දින වන විටත් නිරවුල් කර නොතිබුණි.

(ඇ) 2011 වර්ෂයේ සිට 2016 දක්වා වූ වර්ෂවලට අදාලව කොන්ත්‍රාත් මත අයකර තිබූ රු.9,852,554 ක රඳවුම් මුදල් මෙම වාර්තාවේ දිනවන විටත් නිරවුල් කර නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂය අවසන් දිනට දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙන් ලැබිය යුතු එකතු කල අගය මත බදු ශේෂය ලෙස රු.119,080,785ක් දක්වා තිබූ අතර මෙම ශේෂය සැසඳීම්කර නිරවුල් කරගැනීමට සමාගම කටයුතු කර නොතිබුණි. තවද එම ශේෂයෙන් රු. 73,301,247ක් හෙවත් සියයට 62 ක් වර්ෂ 05 ඉක්ම වූ ශේෂයක් විය.

## 2.4 නීති රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම්

පහත සඳහන් නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| | නීති රීති, රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම් |
|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ<br>මුදල් රෙගුලාසි 135 | මුදල් වර්ෂය ආරම්භයේදී මුදල් කටයුතු සම්බන්ධයෙන් බලතල පැවරීමක් සිදුකර නොතිබුණි. |
| (ආ) | 2000 ජුනි 27 දිනැති අංක පීඑෆ්/පීඊ 10 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | සමාගමේ අතිරික්ත මුදල් ආයෝජනය මුදල් ඇමතිවරයාගේ එකඟතාවය මත සිදුවිය යුතු බව දක්වා තිබූ නමුත් සමාලෝචිත වර්ෂය තුලදී රු.මිලියන 900 ක මුදලක් අදාළ අනුමැතියෙන් තොරව ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර තිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සමාගමේ මූල්‍ය ප්‍රතිඵලය රු.473,599,862 ක ශුද්ධ ලාභයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ශුද්ධ ලාභය රු. 154,138,605 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.319,461,257 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට නිෂ්පාදනවල විකුණුම් මිල ඉහල යාම හේතුවෙන් විකුණුම් ආදායම රු 250,442,879 කින් වැඩිවීම, වෙනත් මෙහෙයුම් ආදායම් රු.34,018,115 කින් වැඩි වීම, මූල්‍ය ආදායම රු.44,062,741 කින් වැඩිවීම හා විකුණුම් පිරිවැය රු.94,771,147 කින් අඩුවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

| | 2017 | 2016 |
|---|---|---|
| ජංගම අනුපාතය | 2.5:1 | 3.9:1 |
| දල ලාභ අනුපාතය | 66.8 | 51.7 |
| ශුද්ධ ලාභ අනුපාතය | 33.2 | 13.1 |

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂයේ ජංගම අනුපාතය 2.5 ක් හා 3.9 ක් වූ අතර රු.500,902,058 ක් වූ බැංකු අයිරාවක් ලබාගැනීම, සමාලෝචිත වර්ෂයේ ජංගම අනුපාතය අඩුවීමට හේතුවී තිබුණි. තවද 2016 හා 2017 වර්ෂවලදී සමාගමේ දල ලාභ අනුපාතය සියයට 51.7 සිට 66.8 දක්වාද ශුද්ධ ලාභ අනුපාතය සියයට 13.1 සිට 33.2 දක්වාද වැඩි වී තිබූ අතර විකිණීම අවිනිශ්චිත වූ වටිනාකම හා රු. 172,595,797 ක්වූ තොග අවසාන තොගයට ඇතුලත් කිරීම හා රු.110,510,432 ක් වූ අර්ධ නිෂ්පාදිත තොග විකුණුම් පිරිවැයට ඇතුලත් නොවීම ශුද්ධ ලාභ අනුපාතය වැඩිවීම කෙරෙහි ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

#### 4.1.1 සැලසුම් කිරීම

සමාගම විසින් සමාලෝචිත වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර තිබුණද 2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 5(2) ඡේදය ප්‍රකාරව ඇතුළත් කල යුතු අයවැය ලේඛනය, ප්‍රසම්පාදන සැලැස්ම, මානව සම්පත් සැලැස්ම හා අභ්‍යන්තර විගණන සැලැස්ම ඇතුලත් කර එම සැලැස්ම පිළියෙල කර නොතිබුණි. තවද සකස්කර තිබූ සැලැස්මේ ව්‍යාපෘති 14ක් ක්‍රියාත්මක කිරීමට රු.මිලියන 3,135 ක වටිනාකමක් ඇතුළත්කර තිබුණද ඒවා ඉටු කරන කාල පරිච්ඡේදය හා වගකිව යුතු නිලධාරීන් ද එයට ඇතුළත් කර නොතිබුණු අතර සමාලෝචිත වර්ෂය තුලදී එකී ව්‍යාපෘති 14 න් 04 ක් ක්‍රියාත්මක කර නොතිබුණි.

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2011 නොවැම්බර් 09 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව, රාජ්‍ය සම්පත් කළමනාකරණ සංස්ථාවට (එස්ආර්එම්සීඑල්) රු.500,000,000ක අත්තිකාරමක් ප්‍රදානය කර තිබූ අතර, හිඟ අත්තිකාරම් හා පොළිය අයකර ගැනීම සඳහා එම සංස්ථාවට විරුද්ධව අධිකරණ ක්‍රියාදාමයක් තිබියදී මහා භාණ්ඩාගාරයේ හා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීමකින් තොරව අත්තිකාරම් මුදල හා 2017 දෙසැම්බර් 31 දිනට රු.12,421,448ක හිඟ පොලී රඳවා ගත් ඉපැයීම් වලින් කපා හැර තිබුණි.

(ආ) 2017 වර්ෂය සඳහා නීතිඥ සේවාවන් ලබාගැනීමට නීතිපති දෙපාර්තමේන්තුවේ සේවාව ලබාගැනීම කෙරෙහි අවධානය යොමු නොකිරීම හේතුවෙන් නීති වියදම් සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.3,602,201 ක් වැය කර තිබුණු අතර එය පසුගිය වර්ෂයේ නීති වියදම වූ රු.529,856 ක් හා සැසඳීමේදී සියයට 580 ක වර්ධනයක් විය.

(ඇ) සමාලෝචිත වර්ෂය තුළදී සමාගමේ විනෝද චාරිකා වෙනුවෙන් රු.10,058,629 ක් සමාගමේ අරමුදල් වලින් දරා තිබුණි.

(ඈ) සාමාන්‍ය තොගයෙහි ඇතුලත්ව පැවති 2017 දෙසැම්බර් 31 දිනට රු. 168,746,272 ක් වූ වසර ගණනාවක සිට නිකුත් නොවන තොග ශේෂයන් සම්බන්ධයෙන් අවශ්‍ය කළමනාකරණ ක්‍රියාමාර්ග අනුගමනය කර නොතිබුණි.

## 4.3 නිෂ්ක්‍රීය හෝ ඌන උපයෝජිත වත්කම්

පුල්මුඩේ යන්ත්‍රාගාර පරිශ්‍රයේ ස්ථාපිත කිරීම සඳහා 2016 වර්ෂයේදී රු.43,838,767 ක අත්තිකාරම් මුදලක් ගෙවා මිලදී ගෙන තිබූ ඩ්‍රයර් යන්ත්‍රය, මිලදී ගෙන වසර 02 ක් ඉක්මවා තිබුණද නිෂ්පාදන කාර්යයන් සඳහා යොදාගෙන නොතිබුණි.

## 4.4 හඳුනාගන්නා ලද පාඩු

2017 වර්ෂයේදී ඉල්මනයිට් මෙ.ටොන් 9000ක් විකිණීම සඳහා ලැබී තිබූ ලංසු 03 ක් අතුරින් 02 ක් අමාත්‍ය මණ්ඩල තීරණ හා අමාත්‍යාංශයේ උපදෙස් මත අවලංගු වී තිබුණි. එම අවලංගු වූ ලංසුවලින් මෙ.ටොන් එකකට ඇ. ඩොලර් 202.89ක් වූ උපරිම මිලක් ලැබී තිබුණද නැවතත් ලංසු කැඳවා ඇ.ඩොලර් 150 ක මිලකට ඉල්මනයිට් තොගය විකිණීම හේතුවෙන් රු.71,401,500ක පාඩුවක් සමාගමට දැරීමට සිදු වී තිබුණි.

## 4.5 වෙනත් රාජ්‍ය ආයතන වෙත ලබාදුන් ආයතනයේ සම්පත්

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/ 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.3.9 වගන්තියට පටහැනිව සමාගමේ සේවකයින් 05 දෙනෙකු 2015 වර්ෂයේදී අමාත්‍යාංශයට තාවකාලිකව මුදාහැර තිබූ අතර රු.8,226,856 ක් වැටුප් හා දීමනා ලෙස ගෙවා තිබුණි. එහෙත් එම මුදල් මෙම වාර්තාවේ දින වන විටත් ප්‍රතිපූරණය කර ගැනීමට කටයුතුකර නොතිබුණි.

**4.6 කාර්යමණ්ඩල පරිපාලනය**

------------------------------------

ප්‍රධාන කාර්යාලය සඳහා අනුමත කාර්ය මණ්ඩලය 70 දෙනෙකු වුවද 102ක කාර්ය මණ්ඩලයක් අනුයුක්ත කර තිබූ අතර අනුමත නොවූ තනතුරු 2ක් සඳහා නිලධාරීන් 4 දෙනෙකු බඳවාගෙන සමාලෝචිත වර්ෂය තුලදී රු.3,129,678ක මුදලක් දීමනා ලෙස ගෙවා තිබුණි.

**5. තිරසාර සංවර්ධනය**

----------------------

**5.1 තිරසාර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම**

--------------------------------------------------

2017 අගෝස්තු 14 දිනැති අංක එන්පී/එස්පී/එස්ඩීජී/17 දරන ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශ ලේකම් විසින් නිකුත් කරන ලද ලිපිය හා තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර "2030 න්‍යාය පත්‍රය" අනුව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතුව පවතින අතර, සමාලෝචිත වර්ෂයට අදාලව අධිකාරිය විසින් තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක විය යුතු ද යන්න පිළිබඳව දැනුවත් වී නොතිබීම හේතුවෙන් තිරසාර සංවර්ධන අරමුණු, ඉලක්ක හා එම ඉලක්ක කරා ළඟා විය යුතු ආකාරය හා ඉලක්ක මැන බැලීම සඳහා වන දර්ශකයන් හඳුනාගෙන නොතිබුණි.

**6. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

----------------------------------------

**6.1. මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

--------------------------------

2015 ජනවාරි 27 දිනැති අංක පීඊඩී /27 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය ප්‍රකාරව, සෑම රාජ්‍ය සමාගමක්ම මුදල් වර්ෂය අවසන්වී දින 60 ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කළයුතු වුවත් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර තිබුණේ මාස 02 ක ප්‍රමාද කාලයකින් පසුව 2018 අප්‍රේල් 24 දින දීය.

**6.2 අභ්‍යන්තර විගණනය**

----------------------

2017 වර්ෂය සඳහා විගණන සැලැස්මක් සකස් කර තිබුණද එම සැලැස්මට අනුකූලව අභ්‍යන්තර විගණනය සිදුකර නොතිබුණි.

**6.3 විගණන කමිටු**

-----------------

2010 දෙසැම්බර් 14 දිනැති අංක 55 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය ප්‍රකාරව, සෑම මාස 03 කට වරක් විගණන හා කළමනාකරණ කමිටුවක් පැවැත්විය යුතු නමුත් 2016 හා 2017 වර්ෂ සඳහා විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පවත්වා නොතිබුණි.

**6.4 ප්‍රසම්පාදනයන්**

--------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2 මාර්ගෝපදේශය ප්‍රකාරව සමාගම විසින් 2017 වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් සකස්කර නොතිබුණි.

(ආ) විධිමත් ප්‍රසම්පාදන සැලැස්මක් නොමැතිවීම හේතුවෙන් රු.2,415,114 ක් වටිනා ඩෙස්ක්ටොප් පරිගණක 11 ක් හා ලැප්ටොප් පරිගණක 07 ක් අවස්ථා 09 කදී මිලදී ගැනීම හේතුවෙන් ලබාගත හැකිව තිබූ වට්ටම් වාසිය මගහැරී තිබූ අතර 2006 රජයේ ප්‍රසම්පාදන

මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.6.1(අ)(iii) හා 2.8.1 මාර්ගෝපදේශයන්ගෙන් බැහැරව මෙම ප්‍රසම්පාදනය සිදුකර තිබුණි.

(ඈ) 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.2.2 මාර්ගෝපදේශය අනුව, ලංසු ඉදිරිපත් කිරීම සඳහා ජාතික තරඟකාරී ලංසු ක්‍රමය යටතේ දින 21 ක් ලබාදිය යුතු වුවද උපයෝගිතා වාහන ප්‍රසම්පාදනය සම්බන්ධයෙන් දින 12 කට අඩු කාලයක් ලබා දී තිබුණි.

(ඇ) සමාගම විසින් සිදුකර තිබූ ප්‍රසම්පාදනයන්ට අදාල ලංසු ඇගයීම් වාර්තා ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ 7.11.1 වගන්තිය ප්‍රකාරව සම්මත ආකෘතියකට අනුව පිළියෙල කර නොතිබුණි. තවද, ලංසු ඇගයීම් වාර්තාව ඇතුළු සියලු සනාථ කිරීම් සහිතව තාක්ෂණික කමිටු වාර්තාව ප්‍රසම්පාදන කමිටුව වෙත ඉදිරිපත් කල යුතු වුවද, අදාළ වාර්තාව සෘජුවම සැපයුම් නිලධාරී වෙත ඉදිරිපත් කර තිබූ අතර, සැපයුම් නිලධාරී හරහා ප්‍රසම්පාදන කමිටුවට වාර්තා ඉදිරිපත් කර තිබුණි.

(ඉ) පුල්මුඩේ වැඩබිම වෙත වීල්ලෝඩර් යන්ත්‍ර 02 ක අවශ්‍යතාවය හඳුනාගෙන තිබුණද, 2017 මාර්තු 30 දින එක් යන්ත්‍රයක් පමණක් මිලදී ගැනීම සඳහා ජාතික තරඟකාරී ලංසු ක්‍රමයට මිල කැඳවා තිබුණි. පළමු හා දෙවන අවම මිල ඉදිරිපත් කළ ආයතනවල ලංසු නියමිත පිරිවිතර වලට නොමැති බව දක්වා ප්‍රතික්ෂේප කර තිබූ අතර තෙවන අවම මිල වූ රු.23,735,000 කට යන්ත්‍රය මිලදී ගෙන තිබුණි. නැවත එම වර්ගයේම වීල්ලෝඩර් යන්ත්‍රයක් මිලදී ගැනීම වෙනුවෙන් 2017 මැයි 07 මිල ගණන් කැඳවා තිබූ අතර එහිදී අවම මිල ඉදිරිපත් කළ, පළමු ප්‍රසම්පාදන අවස්ථාවේ නියමිත පිරිවිතරයන් නොමැති වීම මත ප්‍රතික්ෂේපිත වූ සමාගමෙන් රු.19,739,800 කට එම යන්ත්‍රය මිලදී ගෙන තිබුණි. කෙසේ වුවද එම සැපයුම්කරුගෙන් යන්ත්‍රය මිලදී ගැනීමට පෙර එම මාදිලියට අයත් යන්ත්‍රයක් කුළියට ගෙන අවශ්‍යතාවයට ගැලපෙන බවට තහවුරු කර මිලදී ගැනීම සිදුකර තිබූ අතර පළමු අවස්ථාවේම එපරිදි කටයුතු කර නොතිබීම හේතුවෙන් දින 39 ක් තුල අවස්ථා දෙකකදී මිලදී ගැනීම නිසා රු.9,974,800 ක පාඩුවක් සමාගමට දැරීමට සිදුවී තිබුණි.

## 7. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර සමාගමේ නිසිබලධාරියාගේ අවධානයට යොමුකරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කල යුතුයි.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) තොග පාලනය | (i) | සාමාන්‍ය තොග තුළ ඇතුළත් යල් පැනීම් තත්ත්වයන්, ඉදිරි භාවිතයන් හා වර්තමාන අගයන් සම්බන්ධ තහවුරුවක් ලබාගෙන නොතිබීම. |
| | (ii) | අමුද්‍රව්‍ය හා නිමි තොග නිවැරදිව සත්‍යාපනය නොකිරීම. |
| (ආ) ගිණුම්කරණය | (i) | මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා ජර්නල් සටහන් යෙදීම එක් නිලධාරියෙකු විසින් සිදුකර තිබීම හා අධීක්ෂණයක් සිදු කර නොතිබීම. |
| | (ii) | එකම ජර්නල් සටහන අවලංගු කරමින් නැවත යෙදීම. |
| | (iii) | රඳවාගත් බදු මුදල දළ පොලී ආදායමට එකතු කිරීම. |
| (ඇ) අත්තිකාරම් පාලනය | (i) | අත්තිකාරම් නියමිත වේලාවට පියවා නොතිබීම. |
| | (ii) | අනුමත සීමාව ඉක්මවා අත්තිකාරම් ලබාදීම. |